0113

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**12 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2018**

**ශෛවනෙරි I, II**
சைவநெறி I, II
Saivaneri I, II

**2018.12.03 / 0830 - 1140**

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ශෛවනෙරි I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** දෙවියන්ගේ පස් ක්‍රියා (අයින්තොළිල්) සංකල්පය පැහැදිලි කරන ආකෘතිය,
(1) සෝමස්කන්දර් ය. (2) දක්ශනාමූර්ති ය. (3) අර්ධනාරීස්වරර් ය. (4) නටරාජර් ය.

**2.** ගණ දෙවියන්ට පළඳන ඇඳුම (විනායගර් අංගි) සමග ශිවලිංගය ප්‍රදර්ශනය වන දේවාලය,
(1) පරාලෙ විනායගර් දේවාලයයි. (2) මාමාංග පිල්ලෙයාර් දේවාලයයි.
(3) වෙරුගල් සිත්තිරවේලායුදර් දේවාලයයි. (4) තිරුකේදීශ්වරම් දේවාලයයි.

**3.** වාර්ෂිකව තිරුවන්නාමලෙ හි පැවැත්වෙන විශාල සමාජ උත්සවය හා සම්බන්ධ උපවාසය,
(1) ඒගාදසි ය. (2) විනායගර් ශෂ්ටි ය. (3) තිරුකාර්තිගෛ ය. (4) නවරාත්‍රි ය.

**4.** පෙප්පසි මාසයේ අවපස සදුර්ත්තසියේ සමරනු ලබන උත්සවය හා සම්බන්ධ අසුරයා වනුයේ,
(1) නරගාසුරන් ය. (2) මහිෂාසුරන් ය. (3) තාරගාසුරන් ය. (4) ගජමුගාසුරන් ය.

**5.** පංචාංගයේ සඳහන් වන තාරකා (නක්ෂත්‍ර) සංඛ්‍යාව
(1) හතකි. (2) පහළොවකි. (3) විසිහතකි. (4) හැටකි.

**6.** විවාහ මංගල්‍යයකදී 'රක්ෂාබන්දනම්' යනු,
(1) කන්නිගාදානම් ය. (2) කාප්පු බැඳීම ය.
(3) මුද්ද සොයා ගැනීම ය. (4) මළවුන්ගෙන් ආශිර්වාද ලබා ගැනීම ය.

**7.** දේවාලවල තිබෙන කොඩිගසේ ඇති සළුව මගින් සංකේතවත් වන්නේ කුමක් ද?
(1) පදි (2) පසු (3) ආණවම් (4) කන්මම්

**8.** ත්රෞබදෛ අම්මන් වන්දනාව හා සම්බන්ධ පුරාණ කතා පුවත,
(1) මහා භාරතය ය. (2) රාමායණය ය. (3) සිලප්පදිගාරම් ය. (4) කන්දපුරාණම් ය.

**9.** නායන්මාර්ලාගෙන් දන්සල් (අන්නදානම්) ලබාදී විමුක්තිය අත් කර ගත් නායනාර් වනුයේ,
(1) කාරෙක්කාල් අම්මෛයාර් ය. (2) ඉයට්පගෛ නායනාර් ය.
(3) මෙයිපොරුල් නායනාර් ය. (4) ඉලයාන්කුඩිමාර නායනාර් ය.

**10.** සුන්දරමූර්ති නායනාර් සමග මිත්‍රකම ඇති කර ගත් තිරුවඤ්චෛකලම් හි රජතුමා,
(1) නරසිංහ මුනෛයාර් ය. (2) සේරමාන් පෙරුමාල් ය.
(3) සඩෛයනාර් ය. (4) සේක්කිලාර් ය.

[දෙවැනි පිටුව බලන්න.

**11.** තේරු කරත්ත සැලසුම් කළ යුත්තේ කෙසේදැයි විස්තර කරන ග්‍රන්ථය,
(1) මානසාරම් ය. (2) භගවත්ගීතාව ය. (3) මහාභාරතය ය. (4) සිලප්පදිගාරම් ය.

**12.** 'සගලාගම පණ්ඩිදර්' යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
(1) මරෛඥාන සම්පන්තර් ය. (2) උමාපති සිවාචාරියාර් ය.
(3) මෙයිකණ්ඩදේවර් ය. (4) අරුණන්දි සිවාචාරියාර් ය.

**13.** "දිළිඳු දරුවන්ට පාසලට යාමට නොහැකි නම් පාසල ඒ අය අතරට යා යුතුයි." යනුවෙන් පැවසුවේ,
(1) ස්වාමි විපුලානන්දර් ය. (2) ස්වාමි විවේකානන්දර් ය.
(3) ශ්‍රීලශ්‍රී ආරුමුග නාවලර් ය. (4) ස්වාමි ඥානප්‍රකාසර් ය.

**14.** 'කෝට්ටුප් පූ' යනුවෙන් හඳුන්වන මල් ලබාගන්නේ කුමකින් ද?
(1) ගස්වලින් ය. (2) කුඩා (පෙඩි) ගස්වලින් ය.
(3) ලිය වැල්වලින් ය. (4) ජලජ පැලෑටි වලින් ය.

**15.** සූර්යයා ක්‍රියාකරවනු ලබන දේවතාවා ලෙස සලකනු ලබන්නේ,
(1) වරුණන් ය. (2) අග්නි ය. (3) පිරුදුවි ය. (4) සවිදා ය.

**16.** සුන්දරමූර්ති නායනාර්තුමා තම දකුණු ඇසේ පෙනීම ලබාගත් අවස්ථාවේ ගැයූ ගීතිකාව කුමක් ද?
(1) "පිලෛයුලෙන පොරුත්තිඩුවීර්..." (2) "ඉඩරිනුම් තලරිනුම්..."
(3) "සොට්රුණෛ වේදියන්..." (4) "මීලා අඩිමෛ උමක්කේ..."

**17.** මළවුන්ගේ ආත්ම ඊට පෙර මළවුන්ගේ ආත්ම (පිදිර්) හා එකතු කිරීම සඳහා කරනු ලබන පිළිවෙත
(1) ඒගෝදිට්ටම් ය. (2) අස්ති සංචයනම් ය.
(3) සපින්ඩීකරණම් ය. (4) මගාලයම් ය.

**18.** 'කන්නුසාමි' යන ද්‍රවිඩ ශෛව නාමය ඇති, මහනුවර රාජ්‍යයේ අවසන් රජතුමා,
(1) සේනාසම්මත වික්‍රමබාහු ය. (2) ශ්‍රී වික්‍රම රාජසිංහ ය.
(3) ශ්‍රී විජය රාජසිංහ ය. (4) පළමුවෙනි විමලධර්මසූරිය ය.

**19.** සංගම වන්දනාව මගින් විමුක්තිය ලබා ගත්තේ,
(1) සිරුතොණ්ඩර් ය. (2) තිරුමූලර් ය. (3) කණ්ණප්පර් ය. (4) කුලච්චිරෛයාර් ය.

**20.** ශ්‍රී ලංකාව පාලනය කළ, ශෛව ආගමට විශිෂ්ට මෙහෙවරක් ඉටු කළ ශෛව රජතුමා,
(1) මහාසේන ය. (2) රාවණා ය. (3) පරාක්‍රමබාහු ය. (4) මාමල්ලන් ය.

**21.** ග්‍රාමීය දෙවි කෙනෙකු වන, වෛරව දෙවියන්ට අයත් උපවාස දින වන්නේ,
(1) පංගුණි උත්තරම් සහ ආනි උත්තරම් ය. (2) වෛගාසි විසාගම් සහ ආඩි පූරම් ය.
(3) සිත්තිරෛ පරණි සහ ආඩි පරණි ය. (4) ආවණි ඥායිරු සහ පංකුනි තිංගල් ය.

**22.** 'සිත්තිරපුත්තිරනාර්' යන ග්‍රන්ථයේ සඳහන් කර ඇති පරිදි, මෙලොව කරනු ලබන පව සහ එයට අදාළ දඬුවම නිවැරදිව ගළපා ඇති යුගලය කුමක් ද?
(1) දෙමව්පියන්ට වද දීම ඇණ සහිත ලෑල්ලේ නිදි කරවා කඩුවෙන් කැපීම
(2) මත්පැන් භාවිතය සහ දුම්බීම - උල තැබීම
(3) අනුන්ගේ දේපොළ සොරකම් කිරීම - ගිනි වළට තල්ලු කිරීම
(4) ජීවීන්ට වද දීම දරුණු විෂ නාගයින් ලවා දෂ්ට කරවීම

**23.** "ඒගම් සත් විප්‍රා වහුදා වදන්ති" යන ප්‍රකාශය මගින් පැහැදිලි කෙරෙන මූලික අදහස කුමක් ද?
(1) දෙවි දේවතාවුන් වැඩි දෙනෙකු සිටියි.
(2) එක් දෙවියෙකු පමණක් සිටියි.
(3) දිනපතා දෙවියන් පිදිය යුතු ය.
(4) දේවාලවල දෙවියන් ආශීර්වාද කරමින් සිටියි.

**24.** කච්චියප්පර්ට, කන්දපුරාණම් ගැයීම සඳහා මුරුග දෙවියන් විසින් ආරම්භ කර දෙනු ලැබූ ගීතිකා කොටස වන්නේ,
(1) "උලගෙලාමුණර්න්දු..." ය. (2) "පිත්තා පිරෛසූඩි..." ය.
(3) "මුත්තෛතරු..." ය. (4) "තිගඩසක්කර..." ය.

[තුන්වැනි පිටුව බලන්න.

**25.** ආගමම්වල විස්තර කර ඇති කරුණු පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
   (1) දේවාල ඉදිකරන ස්ථාන, නිර්මාණ ක්‍රම සහ දේවාල චාරිත්‍ර
   (2) පඩිම ඉලක්කණම්, කප්පුගනාර් විනය ක්‍රම සහ දේවාල චාරිත්‍ර
   (3) කප්පුගනාර් විනය ක්‍රම, පිළිම වාත්තු ක්‍රම සහ දේවාල නිර්මාණ ක්‍රම
   (4) පූජකවරුන්ගේ විනය ක්‍රම, රුද්‍ර සහ ඉන්ද්‍රන් වර්ණනා ක්‍රම සහ ආත්ම ලබාගන්නා විමුක්ති

**26.** යජුර් වේදයේ ඇති 'ශ්‍රීරුද්‍රම්' යන කොටසේ ප්‍රශංසාවට ලක්වන දෙවියන් වන්නේ,
   (1) විෂ්ණු ය. (2) මුරුගන් ය. (3) විනායගර් ය. (4) ශිව පෙරුමාන් ය.

**27.** 'තේවාර මුදලිහල්' යනුවෙන් හඳුන්වනු ලබන්නේ කවුරුන් ද?
   (1) සම්බන්තර්, සුන්දරර් සහ මාණික්කවාසහර්
   (2) සම්බන්තර්, අප්පර් සහ සුන්දරර්
   (3) සම්බන්තර්, මාණික්කවාසහර් සහ සේක්කිලාර්
   (4) සම්බන්තර්, අප්පර් සහ සේක්කිලාර්

**28.** තම අපූර්ව නීතිමය කටයුතු හේතුවෙන් ශිව දෙවියන්ගේ 'ඉඩභාරූඩ' දර්ශනය දුටු අයෙකු ලෙස පෙරියපුරාණම් හි ප්‍රශංසාවට ලක්වන රජතුමා වන්නේ,
   (1) රාජරාජ චෝල ය. (2) රාජේන්ද්‍ර චෝල ය.
   (3) මනුනීදිකණ්ඩ චෝල ය. (4) විජයාලය චෝල ය.

**29.** කොක්කට්චෝලේ තාන්තෝන්ඊශ්වරර් දේවාලයේ 'කුඩුක්කෛ කුරුම්' සෙල්ලිපිය කියවීමේ අරමුණ වන්නේ,
   (1) තිරුවිලා උත්සවයට සහභාගි වූ සියලු දෙනාට ගෞරව කිරීම ය.
   (2) තිරුවිලා උත්සවයේ අනුග්‍රාහකයන්ට ගෞරව කිරීම ය.
   (3) දේවාල වන්නක්කර්ලාට දානය ලබාදීම ය.
   (4) 'සංගමර්' යනුවෙන් හඳුන්වනු ලබන වීර ශෛව ඇදුරන්ට උපාධිය ලබා දීම ය.

**30.** දේවාලය වටේ වීදි හතක් නිර්මාණය කර 'සද්‍රංග ක්ෂේත්‍රම්' යනුවෙන් හඳුන්වනු ලැබූ ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ විෂ්ණු දේවාලය,
   (1) වල්ලිපුර ආල්වාර් දේවාලය වේ.
   (2) වණ්ණාර්පන්නෛ පෙරුමාල් දේවාලය වේ.
   (3) පොන්නාලෛ වරදරාජ පෙරුමාල් දේවාලය වේ.
   (4) දෙව්නුවර විෂ්ණු දේවාලය වේ.

**31.** භගවත් ගීතාවේ විස්තර කරනු ලබන අදහස් ඇතුළත් බෞද්ධ ග්‍රන්ථය,
   (1) ත්‍රිපිටකය ය. (2) මහාවංශය ය. (3) චූලවංශය ය. (4) ධම්මපදය ය.

**32.** වාරනාසි (කාසි) හි මඩමක් නිර්මාණය කිරීම සඳහා එම ප්‍රදේශයේ ආණ්ඩුකාරවරයා සමග හින්දුස්තානි භාෂාවෙන් කථා කිරීමට නොහැකි වූ අවස්ථාවේ දෙවියන්ගෙන් විවිධ භාෂා හැකියා ඉල්ලා ගයන ලද මෑතකාලීන ගීතිකාව,
   (1) සගලගලාවල්ලි මාලෛ ය. (2) අභිරාමි අන්තාදි ය.
   (3) තිරුප්පුහල් ය. (4) පරාබරක්කණ්ණි ය.

**33.** ශෛව ආගමික නිවෙස්වල සවස් වරුවේ පහන් දැල්වීමේදී ගායනා කරනු ලබන "ඉල්ලග විලක්කදු ඉරුල් කෙඩුප්පදු..." යන ගීතිකාව ගැයුවේ,
   (1) සම්බන්තර් ය. (2) අප්පර් ය. (3) සුන්දරර් ය. (4) මාණික්කවාසහර්ය.

**34.** දේවාල කුම්භාභිෂේක පිළිවෙත්වල පිළිමය පිරිසිදු කිරීම හඳුන්වනු ලබන්නේ කෙසේ ද?
   (1) ශර්ප්පශා හිදි (2) අෂ්ටබන්ධනම් (3) බිම්භසුත්ති (4) වාස්තුශාන්ති

**35.** තිරුප්පනන්දාල් හි ඇල වී තිබූ ශිව ලිංගය, ශක්තිමත් රැහැනක් තම බෙල්ලේ බැඳ ඇද කෙළින් කර භාස්කම් කළේ,
   (1) කණ්ණප්ප නායනාර් ය. (2) කුංගුලියක්කලය නායනාර් ය.
   (3) අප්පූදියඩිහල් ය. (4) නමිනන්දියඩිහල් ය.

**36.** පවිත්‍ර එළදෙනකගේ ගොම ක්‍රමානුකූලව ගින්නෙන් පුළුස්සා, එහි සුදු වූ කොටස ගෙන, මල් දමා ආරක්ෂා කරනු ලබන විභූති වර්ගය හඳුන්වනු ලබන්නේ කෙසේ ද?
   (1) කට්පම් (2) අනුකට්පම් (3) උභකට්පම් (4) අගට්පම්

**37.** 'කන්ද ශෂ්ටි' උපවාසය සිදු කරන ක්‍රමවේදය ඇතුළත් ප්‍රකාශය කුමක් ද?
(1) කහ වතුරේ දමන ලද නූල් පොට නවයක් එකට ගෙන ගැට නවයක් යෙදූ කාප්පු, කුම්බම් මත තබා පූජා කිරීම
(2) උපවාස ආරම්භක දිනයේ පොටවල් විසි එකකින් යුතු කාප්පු පිරිමින් දකුණු අතේද ගැහැණුන් වම් අතේද පැළඳ ගැනීම
(3) කාර්තිගෙෙ තාරකා දිනයට ඊළඟ දිනය වන රෝහිණී තාරකා දිනයේ ආහාර අනුභව කර (පාරණෙ) උපවාසය අවසන් කිරීම
(4) දින හයක් උපවාසයේ යෙදී සිට හත්වන දින පාරණෙ කර උපවාසය නිමා කර ගැනීම

- පහත සඳහන් වගුවේ A සිට I දක්වා දී ඇති තොරතුරු ආශ්‍රයෙන් අංක **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| **ශෛව ආගම වර්ධනය කළ විද්වතුන්** | **ජීවන සිද්ධිය** | |
|---|---|---|
| A – ආරුමුග නාවලර් | D – 'ප්‍රබෝද චෛතන්‍යර්' යන බ්‍රහ්මචර්ය නාමයෙන් පිදුම් ලැබීම | G – තිරුමන්දිරම් |
| B – විපුලානන්දර් | E – අවුරුදු 3000ක් ජීවත් වීම | H – බාලපාඩම් |
| C – තිරුමූලර් | F – ඉඩෝර කාලයේදී 'කංජිතොට්ටි' නිර්මාණය කර දන්සල් ලබා දීම | I – යාල්නූල් |

**38.** 'මුත්තමිල් විත්තගර්' යනුවෙන් ප්‍රශංසා කරනු ලැබූ අය හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) AFH (2) BDI (3) BEI (4) CEG

**39.** 'අන්බේ සිවම්' යනුවෙන් සඳහන් කළ අය හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) ADG (2) AFH (3) CEG (4) CDI

**40.** 'විද්‍යානුබාලන යන්ත්‍රසාලෛ' යන මුද්‍රණාලය ස්ථාපිත කළ අය හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) AEH (2) AFH (3) BDI (4) CFH

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**12 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2018**

**ශෛවනෙරි I, II**
சைவநெறி I, II
Saivaneri I, II

## ශෛවනෙරි II

※ **පළමුවන** ප්‍රශ්නය හා **දෙවන** ප්‍රශ්නය ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
※ පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, අනෙකුත් සෑම ප්‍රශ්නයක් සඳහා ම ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) 'පිල්ලෙයාර් කදෛ' යන උපවාස ග්‍රන්ථය රචනා කළේ කවු ද?
(ii) ආවනි මාසයේ පොහොය දිනට පෙර සිකුරාදා පිළිපදිනු ලබන උපවාසය කුමක් ද?
(iii) 'තඩුත්තාට්කොණ්ඩ පුරාණම්' ඇතුළත් වන ග්‍රන්ථය කුමක් ද?
(iv) සිවාගමම් රචනා කරනු ලැබුවේ කවුරුන් විසින් ද?
(v) 'ගංගාදර පුට්කරණී' යන තීර්තම් අයිති වන දේවාලය කුමක් ද?
(vi) තේරු උත්සවයෙන් හැඟෙනු ලබන දේව ක්‍රියාව කුමක් ද?
(vii) උමාපති සිවාචාරියාර් විසින් කරන ලද හාස්කම් **දෙකක්** ලියන්න.
(viii) ශෛව භක්තිකයින් සමරන උත්සව **දෙකක්** සඳහන් කරන්න.
(ix) ශෛව භක්තිකයෙකු ලබා ගත යුතු තීක්ෂා **දෙකක්** නම් කරන්න.
(x) පංචපුරාණම් ගැයීමේදී පිළිපැදිය යුතු පිළිවෙල **හතරක්** සඳහන් කරන්න.

**2.** (i) පහත සඳහන් ගීතිකා **දෙකක්** නිවැරදිව හා නියම අනුපිළිවෙළට ලියන්න.

(ii) ඉහත (i) ට අදාළ ව ඔබ විසින් ලියන ලද ගීතිකාවල තේරුම ලියන්න.

(අ) "මීලා අඩිමෛ උමක්කේ ආලායි…"
(ආ) "කට්ටුවර් විලුංගුම්…"
(ඉ) "පාලුක්කු පාලගන් වේණ්ඩියලුදිඩ…"
(ඊ) "මූවිරු මුගංගල් පෝට්ට්‍රි…"
(උ) "පච්චෛමාමලෛ පෝල්මේනි…"

**3.** "ශෛව ආගමික ග්‍රන්ථ උසස් සාරධර්ම පිළිබඳව අවධාරණය කරයි."

(i) 'සත්‍යය ජයගනී.' යන දර්ශනයට අනුව ජීවත් වූ **දෙදෙනෙකු** සඳහන් කරන්න.
(ii) නැති බැරි අයට යමක් ලබාදීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියා **තුනක්** සඳහන් කරන්න.
(iii) 'ශෛව ආගම යනු ආදර මාර්ගයයි.' යන්න පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

**4.** "තිරුමුරෛහල් දොළොහ එක්රැස් කරනු ලැබීමෙන් පසුව ගයන ලද ගීතිකා පසුකාලීන ගීතිකා ලෙස හැඳින්වේ."

(i) පසුකාලීන ගීතිකා **දෙකක්** සඳහන් කරන්න.
(ii) නාලායිරත් දිව්‍ය ප්‍රබන්ධම් පිළිබඳ කරුණු **තුනක්** ලියන්න.
(iii) 'අභිරාමි අන්තාදි' ගයනු ලැබූ අවස්ථාව පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

**5.** "පදි, පසු, පාසම් යන්න තුන් ද්‍රව්‍ය වේ."

– ශෛව සිද්ධාන්තම් –

(i) ශෛව සිද්ධාන්තම් සඳහන් කරන, පදිගේ තත්ත්ව **දෙක** ලියන්න.

(ii) පසුගේ ගති ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.

(iii) මූම්මලම්වල 'ආණවම්' පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

**6.** "ශෛව සම්ප්‍රදායන් රැකීමෙහිලා ශෛව දේවාලවල දායකත්වය සහ සේවාව උසස් ය."

(i) ශ්‍රී ලංකාවේ තේවාරම් ගයනු ලැබූ ශිව දේවාල **දෙක** සඳහන් කරන්න.

(ii) මඩකලපුවේ පුන්නෛචෝලයි ශ්‍රී භද්‍ර කාලියම්මන් දේවාලයේ සිදුවන ගිනි පැගීමේ පිළිවෙතේ විශේෂතා මොනවා ද?

(iii) නල්ලූර් කන්දස්වාමි දේවාල ඉතිහාසය කෙටියෙන් පැහැදිලි කරන්න.

**7.** පහත සඳහන් ඒවායින් **දෙකකට** කෙටි සටහන් ලියන්න.

(i) නිවසේදී ශෛවම්

(ii) වසන්තන් කූත්තු

(iii) දේවාල වන්දනාවේ අවශ්‍යතා

(iv) ශිව සින්නංගල්

※ ※ ※